චක්‍රලේඛ අංක:- 10/2002

මගේ අංකය:- එම්/1/42
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
340, ආර්.ඒ.ද.මැල් මාවත,
කොළඹ 03.
2002 - 07 - 15

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/
අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත,

විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීම

මා වෙත වාර්තා කර තිබූ සියළුම දිස්ත්‍රික්කවල විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමට දැනටමත් කටයුතු කර ඇත.

02. අයදුම්පත් භාරගන්නා අවසාන දින පිළිබඳව අවධානයෙන් සිට ඒ ඒ කොට්ඨාශ සඳහා ලැබෙන අයදුම්පත් අතරින් අදාල බඳවා ගැනීමේ පරිපාටිය යටතේ සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් උපලේඛණගතකොට නොපමාව ඉදිරි පියවර ගන්නා ලෙස අදාල නිළධාරීන්ට කරුණාකර උපදෙස් දෙන්න.

03. සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේපකොට ප්‍රතික්ෂේප කළ හේතුවද එම අයදුම්කරුවන්ට ලියාපදිංචි තැපෑලෙන් දන්වා යවන්න.

04. අයදුම්පත් උපලේඛණගතකොට එම උපලේඛණ අයදුම්කරුවන් අයදුම් පත්වල සඳහන් කර ඇති සුදුසුකම් පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යැවීමේදී අයදුම්කරුවන්ගේ පදිංචිය හා චර්යාව ආදිය පිළිබඳව විශේෂයෙන් සැළකිලිමත්ව අදාල තොරතුරු නිවැරදිව සොයා බලා වාර්තා කරන ලෙසද දන්වන්න.

05. අයදුම්කරුවන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවූ විට, ඔවුන්ගේ අධ්‍යාපන හා අතිකුත් සහතික වල මුල් පිටපත් මැනවින් පරීක්ෂා කොට ඒවායේ පිටපත් සත්‍ය පිටපත් බවට පරීක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් සහතික කොට අයදුම් පතට අමුණා එවීම ප්‍රමාණවත්ය. මුල් පිටපත් අයදුම්කරුවන්ට ආපසු භාරදෙන්න.

06. අවසානයේ පත්වීම සඳහා තෝරා ගන්නා පුද්ගලයාගේ පමණක් සහතික වල මුල්පිටපත් ගෙන්වා පත්වීම පිරිනැමීමට ප්‍රථම නැවත පරීක්ෂා කිරීම ප්‍රමාණවත්ය.

07. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසු පරීක්ෂණ මණ්ඩලයේ සටහන් උපලේඛණයේද නිවැරදි තීරුවේ ඇතුලත් කර උපලේඛණයේ අන්තිම පිටුවේ පරීක්ෂණ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් විසින් අත්සන් තැබීම අත්‍යවශ්‍යය.

08. අවසාන සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව කිසිම හේතුවක් නිසා හෝ අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කරන සහතික හෝ ලියවිලි භාර නොගත යුතු බවද කාරුණිකව දන්වමි.

2 පිට...

09. අවසාන සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසු සියලුම අයදුම්පත් හා අදාල ලියවිලි ක්‍රමවත්ව ඇත්නම් ඔබගේ නිර්දේශය සහිතව ඒවා අවසාන සම්මුඛ පරීක්ෂණය පවත්වා සති 02 ක් ඇතුලත කරුණාකර මා වෙත එවන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:- 1. ලේකම්/
ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

2. සියළුම පළාත් භාර ස. රෙජි. ජනරාල්වරුන්

3. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

4. සියළුම ඉඩම් හා අතිරේක දිසාලේකම්වරුන්

5. ප්‍රධාන කාර්යාලයේ මා. නිළධාරීන්

සකු.